# එකමුතුකමේ බලේ



හෙසලි රන්තොටුවිල

## පිදුම

**මේ පොත ලියන්න උදව් කරපු**

**අප්පච්චිට, අම්මට, මල්ලී සෙනුක් ට**

**හා නංගී සහෙළි ට...**



# එකමුතුකමේ බලේ

**ආර්. පී. හෙසලි  යාත්‍රා රන්තොටුවිල**

**කර්තෘ ප්‍රකාශනයකි**

**ප්‍රථම මුද්‍රණය - 2023**

**ISBN 978-624-206-640-0**

## කතුවරියගේ වෙනත් කෘති

**ලේන් අම්මාගේ ආදරේ - ISBN 678-624-206-013-2 - 2020**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

**2023** සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**2023 . 11 . 01**

ඒකමත් එක කාලෙක සිටියා කුඩා ගැහැනු ළමයෙක්. එයාගේ නම මලී. එයාට හොඳම හොඳ යාළුවෝ ගොඩක් හිටියා. ඉතින් මලී ගේ යාළුවෝ වුණේ සත්තු.

මලී හැමදාම උදෑසනින්ම නැගිටලා දත් මැද මුහුණ සෝදා ලස්සන ඇඳුමක් ඇඳගෙන මුළුතැන්ගෙට ගොස් රසවත් කෑම සාදා වට්ටියකට දමා නිවසින් පිටතට යනවා.



එළියේ තිබෙන බංකුවක වාඩි වී මලී "එන්න, එන්න යාළුවනේ කෑම කන්න" යැයි කෑ ගසනවා. ඒ සද්දෙ ඇහුණාම සත්තු යහළුවෝ දුවගෙන මලී ළඟට එනවා. ඉතින් මලී යාළුවෝ එක්ක ආහාර බෙදාගෙන කනවා.

එක් දවසක එතන හිටපු මුව පැංචා "අපි දැන් කෑම කාලා ඉවරයිනේ, අපි වත්තට ගිහින් හොඳට සෙල්ලම් කරමු" යි කීවා.

මලීයි, යාළුවොයි වත්තට සෙල්ලම් කරන්න ගියා. සෙල්ලම් කරන්න ඉස්සරවෙලා හා පැංචි "අපි දැන් මොනවද කරන්නේ?" යි ඇහුවා.

එළු හාමි "අපි අල්ලන සෙල්ලම් කරමු" කිව්වා .



සෙල්ලම් කරද්දී මලීට පිපාසයක් දැනුනා. එයා යාළුවන්ට කියා දුවගෙන ගෙදර ගියා.


මුළුතැන්ගෙයි ගොස් මලී වතුර වීදුරුවක් බොන අතර වත්තේ සෙල්ලම් කර කර හිටපු යාළුවන්ට අමුතු සද්දයක් ඇහුණා. බය වූ යාළුවෝ මලීගේ ගෙදරට දුවගෙන ගියා. යාළුවෝ හැමෝම “මලී” කියා කෑ ගැහුවා.



මලී මුළුතැන්ගෙයින් එළියට ගිහින් ඉක්මනට දොර ඇරියා.

මලී දොර ඇරපු ගමන් යාළුවෝ එකපාරටම ගෙදර ඇතුළට ආවා.

"ඇයි මේ හදිසියෙන්ම ගේ ඇතුළට පැන්නේ" කියලා මලී බයෙන් ඇහුවා.



"අපි ඔයා නැතුව සෙල්ලම් කර කර ඉද්දි අපට අමුතු සද්දයක් ඇහුනා" යි යාළුවෝ කිව්වා. ඒක අහපු මලී යාළුවොත් එක්ක වත්තට ගියා.

ඒත් කිසිම සද්දයක් ඇහුණ නෑ. ඒ නිසා මලී යාළුවන්ට "අපි හෙට උදේට බලමු" යි කිව්වා.

හවස් වුණ නිසා හැමෝම තම තමන්ගේ ගෙවල් වලට ගියා.

අනිත් දවසේ උදෑසනින්ම වෙනදා වගේ මලී නැගිටලා යාළුවොත් සමග කෑම කා වත්තට ගියා. වත්තට ගිය මලීටත් යාළුවන්ටත් අර අමුතු සද්දේ ඇසුනා. මලී ඉතින් බය නැතුව සද්දේ ඇහුණ තැනට ගියා.



ඒත් සත්තු යාළුවෝ බය නිසා එතනට ගියේ නෑ. ඒත් හා පැංචි මලිත් එක්ක ගියා. අමුතු සද්දේ ඇසුනේ ගස උඩින්. මලී උඩ බැලුවත් ඒ සද්දේ මොකක්ද කියලා හිතාගන්න බැරිවුණා.

ඉතින් එයාගේ යහළුවෙක් වුණු බට්ටිච්චාට මලී කතා කළා. මලී බට්ටිච්චා ට කිව්වා "ඔයාට පුලුවන්නේ පියාඹන්න, ඒක නිසා මේ ගහ උඩට ගිහින් බලන්න කාගේද ඔය අමුතු සද්දේ" කියලා.



බට්ටිච්චා උඩට ගියා. බට්ටිච්චා දැක්කා පූස් පැටියෙක් බය වෙලා ගහ උඩ ඉන්නවා. ඒක කියන්න බට්ටිච්චා පියාඹාගෙන පහලට ආවා. බට්ටිච්චා "මම පූස් පැටියෙක් බය වෙලා ගහ උඩ ඉඳන් කෑගහනව දැක්කා" කිව්වා.

මලී යාළුවෝ හැමෝටම කතා කළා. හැමෝම මලී ළඟට ආවා. මලී වලස් පැංචාට කතා කලා. "ඔයාට හොඳට ගස් උඩ නගින්න පුළුවන්නේ, ඒක නිසා ඔයා අර ගහ උඩ ඉන්න අසරණ පූස් පැටියා ව බිමට අරන් එන්න" කිව්වා. වලස් පැංචා වේගයෙන් ගස උඩට නැග්ගා.



ඊට පස්සේ ගස උඩ හිටපු අසරණ පූස් පැටියාව මලීට දුන්නා. වලස් පැංචා කරපු දේට හැමෝම සතුටින් අත්පුඩි ගැහුවා. මලී හුඟක් සතුටු වුණා.

මලී පූස් පැටියාව හැමෝටම අතගාන්න දුන්නා. හැමෝම සතුටු වුණා. පූස් පැටියාට බඩගිනි ඇති කියලා හා පැංචි, වලස් පැංචා, බලු පැංචා, එළු හාමි සහ බට්ටිච්චා එක්ක එකතු වෙලා කෑම හොයන් ආවා.



පුස් පැටියටත් අළුත් යාළුවෝ හම්බ වුණ නිසා හරිම සතුටුයි.



ඊට පස්සේ හැමෝම පූස් පැටියාගේ අම්මා හොයන්න ගියා. ඒකට මුල්තැන ගත්තේ බලු පැංචා. හොඳ ඉවක් තියෙන නිසා එයා ඉක්මනට පූස් පැටියා නැතුව දුකෙන් හිටපු පූස් අම්මාව හොයා ගත්තා.

පූස් අම්මා පැටියා තුරුල් කරගෙන යාළුවෝ හැමෝටම ස්තූති කළා. හැමෝගෙම හිත් සතුටින් පිරුණා.



අපි හැමෝම එකමුතුව සමගියෙන් පූස් පැටියා ව සොයා ගත්ත නිසා හැමෝම සතුටින් නේද කියලා මලී යාළුවන්ගෙන් ඇහුවා. හැමෝම “ ඔව් ” කියලා සතුටින් පිළිතුරු දුන්නා.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

9 786242 066400